දුරකථන ) 0112669192,0112675011
தொலைபேசி ) 0112698507, 0112694033
Telephone ) 0112675449, 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
Website )

මගේ අංකය )NA/05/Annual/01/2026
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
YourNo. )

දිනය )2026.04.
திகதி )
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

පොදු චක්‍රලේඛ අංක - 01-23/2026

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ජාතික රෝහල

අධ්‍යක්ෂ, ජාතික රෝහල මහනුවර /ගාල්ල,

ලේඛීය අමාත්‍යාංශයට අයත් සියලුම ශික්ෂණ රෝහල්, මහ රෝහල්, මූලික රෝහල් අධ්‍යක්ෂවරුන් ඇතුළු,

ලේඛීය අමාත්‍යාංශය මගින් පාලනය වන සියලුම සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්

**<u>හෙද නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026</u>**

ලේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියලුම රෝහල් සහ සෞඛ්‍ය ආයතනවල සේවය කරන ස්ථාන මාරු අපේක්ෂාවෙන් සිටින III,II,I සහ අධි ශ්‍රේණිවලට අයත් තනතුරුධාරී නොවන හෙද නිලධාරීන්ගෙන් 2026 වර්ෂයට අදාළව වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.
**I ශ්‍රේණියේ, අධි ශ්‍රේණියේ සහ විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා / අධ්‍යාපන / මහජන සෞඛ්‍ය) යන තනතුරුධාරී හෙද නිලධාරීන්ට මේ සඳහා අයදුම් කළ නොහැක.**

02. පහත සුදුසුකම් සපුරා ඇති හෙද නිලධාරීන්ට මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැකි වේ.

I. උතුරු හා නැගෙනහිර පළාත්වල ලේඛීය අමාත්‍යාංශයට අයත් රෝහල්වල සේවය කරන 2025.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර 02 ක අවම සේවා කාලයක් සම්පූර්ණ කරන හෙද නිලධාරීන්ට,

II. මහරගම අපේක්ෂා රෝහල, ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය(NIMH), ජාතික බෝවන රෝග විද්‍යායතනය(IDH) සහ ස්වසන රෝග පිළිබඳ ජාතික රෝහල - වැලිසර යන ආයතනයන්හි දැනට සේවය කරන 2025.12.31 දිනට වසර 02 ක අවම සේවා කාලයක් සම්පූර්ණ කරන හෙද නිලධාරීන්ට,

III. උක්ත I සහ II හි සඳහන් නොවන අනෙකුත් සියලුම ලේඛීය අමාත්‍යාංශයට අයත් රෝහල් හා සෞඛ්‍ය ආයතනවල සේවය කරන 2025.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර 04 ක අවම සේවා කාලයක් සම්පූර්ණ කරන හෙද නිලධාරීන්ට,

IV. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (පාලන) V මගින් යුධ හමුදා රෝහල, ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සහ සීදුව විජය කුමාරතුංග අනුස්මරණ රෝහල , ශ්‍රීමත් ජොන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත, අනුයුක්ත කර සිටින 2025.12.31 දිනට අදාළ රෝහල්වල සේවා කාලය වසර 02 ක් සම්පූර්ණ කරන ලද වෛද්‍ය නිලධාරීන්ට (එම රෝහල්වල 2025.12.31 දිනට වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කළ වෛද්‍ය නිලධාරීන් අනිවාර්යයෙන් ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, **නැතහොත් ඔවුන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) II විසින් නියම කරනු ලබන ඕනෑම රෝහලක් වෙත අනිවාර්යයෙන් අනුයුක්ත කිරීමට කටයුතු කරනු ලැබේ).**

V. 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා අනුප්‍රාප්තික නිලධාරියෙකු ලද මෙතෙක් ස්ථාන මාරුව ලද ස්ථානයේ සේවයට වාර්තා කර නොමැති නමුත්, එම ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය කල් දැමීම සඳහා අනුමැතිය ලද ස්ථාන මාරු නියෝග ඇති සහ ප්‍රසූත නිවාඩු ලැබීම හේතුවෙන් ස්ථාන මාරු ක්‍රියාත්මක නොවූ නිලධාරීන්ගේ ස්ථාන මාරු නියෝග, තවදුරටත් ඒ අයුරින්ම වලංගු වන අතර, **ඔවුන් විසින් නැවත ස්ථාන මාරු සඳහා අයදුම් කළ යුතු නොවේ.** එසේ අයදුම් කරන නිලධාරීන්ගේ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බවද අවධාරණය කරමි. අනෙකුත් සියලුම වාර්ෂික ස්ථාන මාරු නියෝග මෙයින් අවලංගු වේ.

VI. 2024 වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේ දී උතුරු / නැගෙනහිර සේවය කරන නිලධාරීන් තමා ස්ථාන මාරු යාමට ඉල්ලා සිටින ලද රෝහල වෙත ස්ථාන මාරු නොලැබ වෙනත් අභියාචනා කැඳවීමේ දී ජේෂ්ඨ අමාත්‍යාංශයේ රෝහලකට සේවා අවශ්‍යතාව මත ස්ථාන මාරු ලැබීමට කැමැත්ත ප්‍රකාශ කළ නිලධාරීන්ට ඔවුන්ගේ උතුරු/ නැගෙනහිර සේවා කාලය ද වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය ද යන දෙකම එක්ව සලකා කටයුතු කර මෙවර වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

VII. ජේෂ්ඨ අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් හා සෞඛ්‍ය ආයතනවල සේවයේ නියුතු වෛද්‍ය නිලධාරීන් තම මනාපය පරිදි **බස්නාහිර පළාත් සභාව යටතේ පාලනය වන රෝහලක්/ සෞඛ්‍ය ආයතනයක් වෙත** ස්ථාන මාරු ඉල්ලුම් කරන්නේ නම් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ නියමය පරිදි, නිලධරයා සිය තනතුරෙහි හෝ සේවයේ ස්ථිර කර තිබීම අනිවාර්යය බවත් හා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී සේවය ස්ථිර කිරීමේ ලිපියේ සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුවේ.

03. අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ දක්වා ඇති http://www.health.gov.lk මගින් මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ අයදුම්පත් සම්පූර්ණ කිරීම මගිනි.

**අයදුම් කරන්නන් සඳහා උපදෙස්**

I. අයදුම්කරුවන් අනිවාර්යයෙන් ම සෞඛ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ දක්වා ඇති **http://previousmoh.health.gov.lk//NOIMS_2026/** යන සම්බන්ධතාවය (link) මගින් හෝ මෙහි සඳහන් **QR** කේතය භාවිතා කරමින් වෛද්‍ය නිලධාරීන් සඳහා ආරම්භ කර ඇති තොරතුරු පද්ධතියේ ලියාපදිංචි විය යුතු වේ. ඒ සඳහා අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කළ යුතු ය. එම ලියාපදිංචියේ දී ඔබ වෙත ලැබෙන නාමය (User Name) සහ මුරපදය (Pass Word) සුරැකිව තබා ගැනීමට කටයුතු කළ යුතු ය.

II. එක් නිලධාරියෙකු විසින් එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කිරීමට තරයේ වග බලා ගත යුතු ය. අයදුම්පත් කිහිපයක් ඉදිරිපත් කරන නිලධාරීන්ගේ අයදුම්පත් හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරනු ලැබේ.

III. 2026 මැයි 20 දින මාර්ගගත ක්‍රමය මගින් අයදුම්පත් යොමු කිරීමට ලබා දී ඇති අවසන් දිනය වන අතර, ඉන් පසු ඒ සඳහා කිසිදු අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

IV. යම් නිලධාරියෙකුට අයදුම්පතේ සඳහන් තොරතුරුවල වෙනස්කම් කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා 2026.05.20 දින දක්වා අවස්ථාව ලැබේ. එබඳු අවස්ථාවල දී අවසන් වරට නිවැරදි කරන ලද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත රෝහලේ පෞද්ගලික ලිපිගොනුව විෂය භාර නිලධාරියා වෙත ඉදිරිපත් කර රෝහල් ප්‍රධානියා මගින් මෙම ආයතනය වෙත එවීමට කටයුතු කළ යුතු ය.

V. මාර්ගගත අයදුම්පත මගින් ඉල්ලා ඇති සියලු ම තොරතුරු අයදුම්කරු විසින් සම්පූර්ණ කර ඉදිරිපත් (submit) කළයුතු අතර, ඉන් අනතුරුව අයදුම්කරු වෙත ලැබෙන අයදුම්පතේ PDF මෘදු පිටපත (Softcopy) පරිගණක මුද්‍රණ යන්ත්‍රයක් ආධාරයෙන් මුද්‍රණය කර, අයදුම්කරුගේ අත්සන හා දිනය සටහන් කිරීමෙන් පසු, සේවය කරන රෝහලේ ප්‍රධාන විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි / නිලධාරිනිය මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව, අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව විෂය භාර නිලධාරියා වෙත භාර දීමට කටයුතු කළ යුතු වේ.

VI. අදාළ විෂය ලිපිකරු විසින් අයදුම්කරුගේ අයදුම්පතේ සඳහන් කර ඇති සියලුම තොරතුරු ඔහුගේ හෝ ඇයගේ පෞද්ගලික ලිපිගොනුවට අනුව නිවැරදි බවට තහවුරු කර, රෝහල් ලේකම් / පරිපාලන නිලධාරි මගින් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

VII. ආයතන ප්‍රධානියා විසින් නිර්දේශ කර, නිල මුද්‍රා තබන ලද අයදුම්පත් මෙම චක්‍රලේඛයේ ඇමුණුම 01 ලෙස දක්වා ඇති උප ලේඛනය අනුව සම්පූර්ණ කර, ආවරණ ලිපියක් ද සමඟ පහත ලිපිනය වෙත අතින් ගෙනවිත් භාර දීමට කටයුතු කළ යුතු වේ.

**අධ්‍යක්ෂ (පාලන) I,**<br>
**පාලන 1 අංශය, 3 වන මහල,**<br>
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,**<br>
**අංක 106,**<br>
**ඩඩ්ලි සේනානායක මාවත,**<br>
**කොළඹ 08.**

VIII. වැඩිදුරටත් යම් පැහැදිලි කිරීමක් අවශ්‍යවන්නේ නම් දුරකථන අංක 011-2674967 හෝ 011-2693753 මගින් විමසිය හැකි වේ.

04. අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීමට ලබා දී ඇති කාලය **2026.05.20** දිනෙන් අවසන් වේ. ආයතන ප්‍රධානී විසින් නිර්දේශ කළ අයදුම්පත්, අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනය වන **2026.05.30** දිනට ප්‍රථම මෙම අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (පාලන) I ශාඛාව වෙත ලැබීමට සැලැස්වීම ආයතන ප්‍රධානියාගේ වගකීමක් වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අයදුම්පත් යොමු කිරීමේ දී සැලකිය යුතු විශේෂ කරුණු

I. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු කළ ද, එහි මුද්‍රිත පිටපතක් අනිවාර්යයෙන් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ද සහිතව ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොකරන ලද අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. සෑම අයදුම්කරුවෙක්ම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතු අතර, සෑම නිලධාරියකු පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු ඉදිරිපත් කරනු ලබන බවට සෑම ආයතන ප්‍රධානියෙක් විසින්ම වගබලා ගත යුතු ය.

III. මෙම නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සිය ආයතනයේ ප්‍රසූත නිවාඩු, විශේෂ නිවාඩු, තාවකාලික ස්ථාන මාරු ආදිය ලැබ සිටින හෙද නිලධාරීන් ද ඇතුළුව අදාළ සෑම නිලධාරියෙකුටම දැන ගැනීමට සැලැස්විය යුතු ය. සාවද්‍ය තොරතුරු සැපයීමෙන් හෝ සුදුසුකම්ලත් නිලධාරීන්ට අයදුම්කිරීමට අවස්ථාව නොලැබීමෙන් හෝ ඇතිවන අපහසුතාවන් පිළිබඳව මෙම අමාත්‍යාංශය වග නොකියන අතර, ඒ සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානීන් වගකීමට බැඳෙන බව කාරුණිකව දන්වමි.

IV. මෙම චක්‍රලේඛයට අනුව ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන සියලුම දෙනාට ස්ථාන මාරු ලබාදෙන බවක් මෙහි සඳහන් වගන්ති කිසිවකින් අදහස් නොකරන අතර, එසේ තේරුම්ගත යුතු ද නොවේ.

V. පළාත් සභා යටතේ පාලනය වන රෝහල් සහ සෞඛ්‍ය ආයතන සඳහා ස්ථිරව මුදාහැරීමට ඉල්ලුම් කර, සුදුසුකම් සපුරාලන නිලධාරීන් සඳහා අදාළ පළාතේ පුරප්පාඩු පවතී නම් පළාත් එකඟතාව ලබා ගැනීමට යටත්ව ස්ථාන මාරු නියෝග නිකුත් කරනු ලැබේ. එසේ වුව ද අදාළ පළාත් එකඟතාවන් ලබා ගැනීමෙන් අනතුරුව ඔවුන් පළාත වෙත මුදාහරින ලෙස ආයතන ප්‍රධානීන් වෙත දැනුම් දෙන තුරු ඔවුන් මුදාහැරීම නොකළ යුතු බව අවධාරණය කරමි.

06. වාර්ෂික ස්ථාන මාරු කාලසටහන

| අංක | කාර්යය | දිනය |
|---|---|---|
| 01. | වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවීම | අප්‍රේල් 20 |
| 02. | අයදුම්පත් කැඳවීම සඳහා වෙබ් අඩවියේ පළ කිරීම | අප්‍රේල් 21 |
| 03. | මාර්ගගත (online) ක්‍රමය මගින් අයදුම්පත් සම්පූර්ණ කර ඉදිරිපත් (submit) කිරීම | මැයි 21 |
| 04. | මාර්ගගත (online) ක්‍රමය මගින් ඉදිරිපත් කළ අයදුම්පත්වල මුද්‍රිත පිටපත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | මැයි 30 |
| 05. | වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් ඇතුළත් කර ලැයිස්තු සකස් කර අවසන් කිරීම | ජූනි 30 |
| 06. | වාර්ෂික ස්ථාන මාරු කමිටු රැස්කිරීම සහ ස්ථාන මාරු නිර්දේශ ලබා ගැනීම | ජූලි 01 |
| 07. | වාර්ෂික ස්ථාන මාරු නිර්දේශ අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පළ කිරීම සහ අභියාචනා කැඳවීම | ජූලි 15 |
| 08. | මාර්ගගත (online) ක්‍රමය මගින් අභියාචනා අයදුම්පත් සම්පූර්ණ කර ඉදිරිපත් (submit) කිරීම | ජූලි 31 |
| 09. | මාර්ගගත (online) ක්‍රමය මගින් ඉදිරිපත් කළ අභියාචනාවල මුද්‍රිත පිටපත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | අගෝස්තු 10 |
| 10. | අභියාචනා ඉල්ලීම් ද ඇතුළත් කර නැවත ස්ථාන මාරු ලැයිස්තු සකස් කර අවසන් කිරීම | අගෝස්තු 20 |
| 11. | අභියාචනා මණ්ඩලය රැස්කර අභියාචනා සඳහා නිර්දේශ ලබා ගැනීම | අගෝස්තු 26 |
| 12. | වාර්ෂික ස්ථාන මාරු ලේඛනය ප්‍රසිද්ධ කිරීම | සැප්තැම්බර් 05 |
| 13. | වාර්ෂික ස්ථාන මාරු සඳහා අවසන් ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | 2020 හෙද කණ්ඩායමට පත්වීම් ලබා දීමට සමගාමීව |

07. ලැබෙන සියලුම ස්ථාන මාරු ඉල්ලීම් ඇතුළත් කර, ඉල්ලුම්කරු වර්තමාන **සේවා ස්ථානයට** වාර්තා කළ දිනය අනුව **ජ්‍යෙෂ්ඨතා ලේඛනයක් සකස්** කරන අතර, එකම දින සේවයට වාර්තා කළ නිලධාරීන් සඳහා **සිසු හෙද පුහුණුවේ අවසන් පරීක්ෂණයේ දී ලබාගත් දිවයිනේ කුසලතාවට අනුව, ජ්‍යෙෂ්ඨතාව තීරණය කරනු ලැබේ.** එම ලේඛනය ස්ථාන මාරු මණ්ඩලයක් වෙත යොමු කර, එම මණ්ඩලයේ නිර්දේශ අනුව **2025.12.31** දිනට 02 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරාලන හෙද නිලධාරීන් සඳහා ස්ථාන මාරු නියෝග නිකුත් කරනු ලැබේ. එම නියෝග www.health.gov.lk යන සෞඛ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පළ කර අභියාචනා කැඳවන අතර, අභියාචනා මණ්ඩලයේ නිර්දේශ ද සලකා බලා සකස් කරනු ලබන ස්ථාන මාරු නියෝග සහිත අවසන් ලේඛනය නැවත www.health.gov.lk යන සෞඛ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. එසේම ස්ථාන මාරු සම්බන්ධව විමසීම් කිරීම සඳහා වරින් වර මෙම අමාත්‍යාංශය වෙත පැමිණීම අනවශ්‍ය බවට නිලධාරීන් දැනුවත් කිරීම මැනවි.

08. 2026 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය සිදුවන කාල වකවානුවේ දී තාවකාලික ස්ථාන මාරු සහ වෛද්‍ය හේතු මත ක්‍රියාත්මක වන ස්ථාන මාරු හැර අනෙකුත් සියලුම ස්ථාන මාරු අත්හිටුවන බව ද නිලධාරීන් දැනුවත් කිරීම මැනවි.

09. 2026 වර්ෂය සඳහා ස්ථාන මාරු නියෝග ලද හෙද නිලධාරීන් සඳහා අනුප්‍රාප්තිකයින් 2020 සිසු හෙද කණ්ඩායම මගින් ලබාදීමට නියමිත අතර, අනුප්‍රාප්තිකයින් පිළිබඳ විස්තර ද ඇතුළත්ව ස්ථාන මාරු ලබන නිලධාරීන් පිළිබඳව ලිඛිතව ආයතන ප්‍රධානීන් දැනුවත් කරනු ලැබේ.

10. රෝගී සත්කාරක සේවාව යාවත්කාලීනව පවත්වාගෙන යාම හෙද සේවාවේ මූලික අරමුණ බැවින් ස්ථාන මාරු නියෝග ලැබුවද අනුප්‍රාප්තිකයන් රහිතව, රෝහල් සේවාව අඩාල වන අයුරින් නිලධාරීන් මුදා හැරීමට කටයුතු නොකරන බව අවධාරණය කරමි.

11. **ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශ හෝ වාර්ෂික ස්ථාන මාරු නියෝග කිසිවෙකුටත් පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.**

12. මෙහි සඳහන් නොවන ස්ථාන මාරු සම්බන්ධයෙන් බලපානු ලබන වෙනත් කරුණු සම්බන්ධයෙන් **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සහ ආයතන සංග්‍රහය ප්‍රකාරව අවසන් තීරණය ගැනීමේ බලය අභිනියෝජනය කරන නිලධාරියා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) II වේ.**

මෙම චක්‍රලේඛයේ සිංහල හා ඉංග්‍රිසි භාෂා අතර අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල පාඨය බලපැවැත්වේ.

චාමික එච්. ගමගේ
අතිරේක ලේකම් (පාලන) II
ලේකම් වෙනුවට

චාමික එච්. ගමගේ
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

පිටපත්:

| | | |
|---|---|---|
| 01. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් | - | කරු. දැ.ගැ.පි |
| 02. හෙද වෘත්තීය සමිති | - | දැ.ගැ.පි |

## හෙද නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු 2026

ආයතනයේ නම - ..........................................................................................

| අනු අංකය | මාර්ගගත (online) අයදුම්පතේ අංකය (Index No) | ස්ථාන මාරු අපේක්ෂිත නිලධාරියාගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය | ශ්‍රේණිය | ඔබ ආයතනයේ සේවයට වාර්තාකළ දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයට අනුව සුදුසුකම් සපුරාලන ලද ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියළුම හෙද නිලධාරීන්ගේ අයදුම්පත් මෙම උපලේඛනයට ඇතුලත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ

අත්සන -..............................................

නම -..............................................

දිනය - ..............................................

පරීක්ෂා කළේ

අත්සන -..............................................

නම -..............................................

දිනය - ..............................................

ආයතන ප්‍රධානියාගේ නිර්දේශය- : ...................................
(අත්සන හා නිලමුද්‍රාව)

දිනය : ...................................

දුරකථන ) 0112669192,0112675011
தொலைபேசி ) 0112698507, 0112694033
Telephone ) 0112675449, 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
Website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) NA/05/Annual/01/2026
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
YourNo. )

දිනය ) 2026.04.
திகதி )
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

**General Circular No - 01-23/2026**

Deputy Director General, National Hospital of Sri Lanka

Director, National Hospital, Kandy / Galle

All Directors of Teaching Hospitals, General Hospitals, Base Hospitals and Heads of Health Institutions under the Line Ministry.

**Annual Transfers of Nursing Officers – 2026**

Applications for Annual Transfers 2026 are called from Nursing Officers in Grade III, II, I and Supra Grade of all hospitals and health institutions under the Line Ministry who expect transfers. **Nursing Officers in Grade I, Supra Grade and Special Grade (Hospital Service, Education and Public Health) are not eligible to apply for these transfers.**

02. Nursing Officers who have satisfied following qualifications are eligible to apply for this.

I. Nursing Officers who are serving in hospitals in Northern and Eastern Provinces which are under the Line Ministry and complete a minimum service period of 02 years at the present service station as at 30.06.2026,

II. Nursing Officers who are serving in Apeksha Hospital - Maharagama, National Institute of Mental Health, National Institute of Infectious Diseases, National Hospital for Respiratory Diseases - Welisara and complete a minimum service period of 02 years as at 30.06.2026,

III. Nursing Officers who are serving in all hospitals and health institution under the Line Ministry which are not listed under above I and II and completed minimum service period of 04 years at the present service station as at 30.06.2026,

IV. Nursing Officers who have been attached to the Army Hospital, Sri Jayewardenepura General Hospital, WijayaKumaranatunga Memorial Hospital - Seeduwa and General Sir John Kotelawala Defense University Hospital by the Director (Admin) V, Ministry of Health & Mass Media and complete a minimum service period of 02 years at the hospitals concerned as at 30.06.2026. (Nursing Officers who complete a service period of 02 years at

the above service stations as at 30.06.2026 shall compulsorily submit applications for transfers. **If not, action will be taken to attach them compulsorily to any hospital determined by the Additional Secretary (Admin) II of Health & Mass Media.**)

V. Transfer orders of the Nursing Officers who have not yet assumed duties at the new service station on the receipt of a transfer order 2024 and a successor and received the approval to postpone the effective date of the transfer order and the transfer orders not effected as the officers concerned were on maternity leave, shall remain further valid. Such officers do not need apply for transfers again. It is emphasized that the applications of the officer who apply as such will be rejected without any notice. All other annual transfer orders are hereby cancelled.

VI. Nursing Officers who applied for transfers 2024 while serving in Northern / Eastern Province and did not receive the hospital he/she requested in granting transfers 2024 and gave consent to be transferred to a hospital under the Line Ministry on exigency of service, may submit their applications for transfers 2026. Reckoning both the service period in Northern / Eastern Province and the service period at the present service station.

VII. Those who are going to apply for the hospitals / Institutions which belongs to the Western Province, compulsory to have confirmed in their post, as per the provisions given by the public Service Commission of the Western Province. It is a must to attach a copy of the confirmation letter with the transfer application while you are submitting it to the Line Ministry.

03. Applications should be filled and submitted online as indicated on the official website of the Ministry of Health http://www.health.gov.lk.

**Instructions for Applicants**

I. Applicants should register with the Information System launched for the Nursing Officers on the official website of Ministry of Health http://previousmoh.health.gov.lk//NOIMS_2026/ or scan this QR code. For that, applicants should use their National Identity Card Number. Applicants should keep the user name and the password they get at the registration with them.

II. Applicants should strictly ensure that they submit only one application. Applications of those who submit several applications will be rejected without any notice.

III. Closing date for online applications is 21.05.2026 and no application will be accepted later than the above date.

IV. The officers may edit the particulars furnished in the application up to 20.05.2026, if necessary. The applicant should submit the printed copy of the application edited for the last time, to the officer in charge of the subject of personal files.

V. The applicant should fill all the particulars required in the application and submit the application online. Then the softcopy (PDF) should be printed using a computer printer and the hard copy printed as such should be submitted to the officer in charge of the subject of personal files placing thereon the date and signature of the applicant with the certification of the chief Nursing Officer in Special Grade of the hospital where the applicant is serving.

VI. The subject clerk concerned should certify that the particulars furnished in the application by the applicant are correct according to his / her personal file and forward it for the recommendation of the Head of Institution through the Hospital Secretary / Administrative Officer.

VII. Applications recommended by the Head of Institution placing his / her official frank should be listed in compliance with the schedule given in Annexure 01 and delivered by hand along with a covering letter to the following address.

**Director (Admin) I**
**Admin 01 Branch, 3rd Floor**
**Ministry of Health & Mass Media**
**No 106, Dudley Senanayake Mawatha,**
**Colombo 08**

VIII. If you require further clarifications please call on 011-2693753 or 011-2674967.

**04. Closing date for online applications is 20.05.2026. The Head of Institution shall be held responsible for taking action to forward the applications recommended by the Head of Institution to reach the Director (Admin) I Branch of this Ministry before 30.05.2026, which is the closing date for applications. Applications received after the closing date of applications, will be rejected without any notice.**

**05. Matters to be considered in submission of applications.**

I. **Even if the applications are submitted online, a printed copy thereof should compulsorily be submitted with the recommendation of the Head of Institution. If you fail to do so your application will be rejected without any notice.**

II. Every applicant should ensure that they furnish accurate and complete information and the Head of Institution should ensure that accurate and complete information is furnished in respect of each officer.

III. Arrangements should be made to bring the contents of this Circular to the notice of all relevant Officers of your Institution including those who are on maternity leave, special leave and received temporary transfer. Where any false information is provided or eligible

officers are deprived of their opportunity to apply and thereby cause any inconvenience, the respective Head of Institution will be held responsible but not the Ministry of Health & Mass Media.

IV. No section in the circular implies that all who submit transfer applications in terms of this circular are granted transfers and it should not be construed so.

V. Officers who are eligible and who have requested to release them permanently to the hospitals and health institutions under the Provincial Councils and, will be issued transfer orders subject to obtaining the consent of the respective Provincial Council if vacancies exist. It is emphasized that, even after the receipt of the consent of the province, no officer should be released until the Head of Institute is informed to release them to the province concerned.

06. **Time table for transfers**

| No | Function | Date |
|---|---|---|
| 01 | Setting up of Annual Transfer Committees | April 20 |
| 02 | Publishing the circular for calling applications on the website | April 21 |
| 03 | Filling and submitting application online | May 21 |
| 04 | Submitting printed copies of applications submitted online to the Ministry of Health & Mass Media with the recommendation of the respective Head of Institute | May 30 |
| 05 | Preparation and finalization of lists of annual transfer applications | June 30 |
| 06 | Summoning annual transfer committees and obtaining recommendations | July 01 |
| 07 | Publishing recommendations on the website of the Ministry and calling appeals | July 15 |
| 08 | Completing the applications for appeals and submitting the same online | July 31 |
| 09. | Submitting the printed copies of applications submitted online to the Ministry of Health & Mass Media with the recommendation of the Head of Institution | August 10 |
| 10 | Finalization of transfer lists, after considering the appeals | August 20 |
| 11 | Summoning the Board of Appeal and obtaining recommendations | August 24 |
| 12 | Publishing the annual transfer list | September 05 |
| 13 | Issuance of final transfer orders for annual transfers | Parallel to grant of appointments to 2020 Nursing Batch |

07. A seniority list will be prepared including all transfer applications received based on the date the officer reported to the present service station. Where there are officers whose date of assumption of duties is same, the seniority will be determined based on the Island merit obtained at the final year examination of Student Nurses' Training. The said list is forwarded to a Transfer Board and transfer orders are issued on the recommendation of the said Transfer Board to the officers who have satisfied qualifications given in the paragraph 02 as at 31.12.2025. Such transfer orders will be published on the website of the Ministry www.health.gov.lk and appeals will be called. The final list containing the transfer orders which is prepared considering the recommendations of the Appeal Board will be published again on the website of the Ministry www.health.gov.lk . You may kindly inform the officers not to visit the Ministry to make inquiries in respect of transfers.

08. You may inform the officers that all the transfers other than temporary transfers and transfers on medical grounds will be suspended during the period of annual transfer procedure 2026.

09. Successors for the Nursing Officers who received transfer orders for the year 2026 are to be provided from the Student Nurses' Batch – 2020 and the Heads of Institutions will be informed in writing of the officers who are issued transfer orders with the details of successors.

10. Main objective of the Nursing Service is to maintain patient care services up to date. Therefore, it is emphasized that no officer will be released without a replacement as the patient care services are affected even though the officer is on transfer order.

**11. Recommendations of the Transfer Board or annual transfer orders will not be informed personally.**

12. **Other matters related to transfers which are not provided with herein will finally be decided by the representing officer Additional Secretary (Admin) II of Health & Mass Media in terms of the Procedural Rules of Public Service Commission and Establishments Code.** In the event of any inconsistency between the texts in Sinhala and English language, Sinhala text shall prevail.

**Chamika H. Gamage**
Additional Secretary (Admin) II
For Secretary

Chamika H. Gamage
Additional Secretary (Administration) II
Ministry of Health & Mass Media
"Suwasiripaya"
Colombo 10.

Copies:

01. Director General of Health Services - F.I Pls.
02. Nurses' Trade Unions - F.I

Annexure 01

**Annual Transfer of Nursing Officers - 2026**

**Name of the Institute** - ...........................................................................................

| No | Index number as per the online application | Name of the Officer Who applied for the transfer | National ID Card No | Grade | Date reported to the current working place |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

It is certified that all names of the Nursing Officers Who have completed requirement of the Annual Transfer Circular and applied for annual transfers have been included in this sub document.

Prepared by

Signature - ...............................................

Name -...............................................

Date -...............................................

Checked by

Signature -...............................................

Name -...............................................

Date -...............................................

Recommendation of the Head of the Institute (Signature and Seal) - :......................................

Date -:......................................